ලංකාදීප

2022 ජූලි මස
4 වැනිදා සඳුදා

5

# ඉන්දියාවෙන් ලංකාවට කිරිපිටි ගේන්න සාකච්ඡා



**ශ්‍රී ලංකාවට අවශ්‍ය කිරි පිටි ඉන්දියාවෙන් ආනයනය කිරීම සම්බන්ධයෙන් ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ මහතා එරට ආහාර සැකසුම් කර්මාන්ත අමාත්‍ය ශ්‍රී පශුපති කුමාර් පරාස් මහතා සමඟ ඉකුත් සති අන්තයේ දී සාකච්ඡා කර ඇත.**

හදිසි අවශ්‍යතාවක් සේ සලකා රටට අවශ්‍ය කිරිපිටි තොග වහා ආනයනයට හා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට එහිදී ඉන්දියාවේ සහයෝගීතාව ප්‍රකාශ වී ඇත.

ඒ අනුව ආහාර සැකසුම් සහ කිරි නිෂ්පාදන ක්ෂේත්‍රවල සහයෝගීතාවක් සඳහා කරුණු සොයා බැලීමට ඉන්දීය අධ්‍යයන කණ්ඩායමක් ළඟදීම ශ්‍රී ලංකාවට පැමිණෙනු ඇතැයි වාර්තා වේ.

මීට අදාළ සාකච්ඡා ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා දෙපාර්ශවයම ප්‍රධාන නිලධාරියෙකු බැගින් නම් කර ඇති අතර ඉදිරි ක්‍රියාමාර්ග සඳහා මාර්ග සිතියමක් සකස් කරනු ඇත.

තමා සහ අගමැති නරේන්ද්‍ර මෝදි ප්‍රමුඛ රජය මෙම දුෂ්කර අවස්ථාවේ දී ශ්‍රී ලංකාවට උපකාර කිරීමට සූදනම් බව අමාත්‍ය පරාස් මහතා මෙහි දී ප්‍රකාශ කර ඇත.

ආහාර සැකසුම් කර්මාන්ත අමාත්‍යාංශයේ සහ නව දිල්ලියේ පිහිටි ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු මෙම අවස්ථාවට සහභාගී වූහ.

ශ්‍රී ලංකාවේ ඉන්දිය මහකොමසාරිස් මිලින්ද මොරගොඩ මහතා ඉන්දීය ආහාර සැකසුම් කර්මාන්ත ඇමැති ශ්‍රී පශුපති කුමාර් පරාස් මහතා හමුවූ අවස්ථාව.